# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 12 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 මැයි මස 3 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 12 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]**

එල්.ඩී.—ඕ. 37/69

**ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මෙම පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 12 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** මෙහි මින් මතු "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන (1967 අංක 1 දරන පනතින් සංශෝධිත) ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනතෙහි 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— **165 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**"සංස්ථාව සතු බලතල.** 5. සංස්ථාවේ කාර්යයන් ක්‍රියාවේ යෙදවීමේ දී පහත සඳහන් බලතල සියල්ල හෝ ඉන් යමක් සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ හැකි ය:—

(i) ඇප ඇති හෝ නැති දීර්ඝ කාලීන හෝ මධ්‍යකාලීන ණය මුදල්වල ආකාර යෙන් හෝ කොටස් හෝ වෙනත් සුරැකුම්පත් මිලයට ගැනීමෙන් හෝ ඒ සඳහා දායක මුදල් ගෙවීමෙන් හෝ වෙන යම් සම්බන්ධතාවක් අත්කර ගැනීමෙන් මුදල් ප්‍රතිපාදනය කිරීම;

(ii) අලුතින් නිකුත් කරනු ලබන ව්‍යාපාර වස්තු, කොටස්, ඇපකර, ණය පත්‍ර, හා වෙනත් සුරැකුම් පත් ප්‍රතිරක්ෂණය කිරීම;

(iii) ආයෝජන ප්‍රභවයන්ගෙන් ලැබෙන ණය සඳහා ඇප වීම;

(iv) සංස්ථාව හා මූල්‍ය සම්බන්ධතාවක් ඇති යම් ව්‍යාපාරයක පාලන මණ්ඩලයෙහි සේවය කිරීම පිණිස සංස්ථාවේ නියෝජිතයකු නම් කිරීම;

(v) උචිත අවස්ථාවන්හි දී සහ එසේ වන විට සංස්ථාවේ ආයෝජන කිසිවක් විකිණී මෙන් නැවත ආයෝජනය කිරීම සඳහා මුදල් ලබාගත හැකි කරවීම;

1—ඒ 04751—11,934 (74/2)

(vi) සංස්ථාවේ ව්‍යාපාර කටයුතුවල කාර්යයන් සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ පිටරටවල ප්‍රභවයන්ගෙන් මුදල් ණයට ගැනීම සහ ලබාගන්නා ලද යම් ණය සඳහා ඇප දීම;

(vii) ශ්‍රී ලංකාවෙහි පෞද්ගලික කාර්මික, කෘෂිකාර්මික හා වාණිජ ව්‍යාපාරවලට කළමනාකාර, කාර්මික හා පරිපාලන උපදෙස් සැපයීම සහ කළමනාකාර, කාර්මික හා පරිපාලන සේවාවන් ලබා ගැනීමෙහි ලා සහාය වීම;

(viii) සංස්ථාවේ කාර්යයන් මුදුන්පත් කර ගැනීම පිණිස වැඩදායක යයි අධ්‍යක්ෂ මණ්ඩලය සලකනු ලබන ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා, සමාගම් හෝ වෙනත් ආයතන සඳහා අනුයෝජිතයන් වශයෙන් ක්‍රියා කිරීම සහ ඒ ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා, සමාගම් හෝ වෙනත් ආයතනවල මුදල් පරිපාලනය කිරීම;

(ix) සංස්ථාවේ අකර්මණ්‍ය මුදල් හා සංචිත උචිත සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(x) යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන් ලෙසකින් එය බැහැර කිරීම;

(xi) සංස්ථාව විසින් දෙන ලද ණයක් සම්බන්ධයෙන් යම් ගෙවීමක් ලැබිය යුතු දින යට පෙර එය භාර ගැනීම;

(xii) යම් කිසි බැංකුවක තැන්පත් ගිණුම් ආරම්භ කිරීම;

(xiii) සංස්ථාවේ ව්‍යාපාර කටයුතුවල කාර්යයන් සඳහා විනිමය බිල්පත්‍ර සකස් කිරීම, භාර ගැනීම හෝ පිටසන් කිරීම;

(xiv) සංස්ථාවේ යම් පරමාර්ථයකට වැඩදායක යයි සංස්ථාවට පෙනී යන අයිතිවාසිකම්, පහසුකම් සහ වරප්‍රසාද කිසිවක් ලබාගැනීම පිණිස ආණ්ඩුවට, යම් පළාත් පාලන ආයතනයකට හෝ යම් සංස්ථාවකට හෝ වෙනත් තැනැත්තකුට යම් ඇපයක් හෝ ආරක්ෂාවක් දීම සහ ආණ්ඩුව, යම් පළාත් පාලන

ආයතනයක් හෝ යම් සංස්ථාවක් හෝ වෙනත් තැනැත්තකු සමග යම් එකඟ වීම්වලට එළඹීම ;

(xv) සංස්ථාවේ සේවකයන්ගේ හෝ හිටපු සේවකයන්ගේ ද ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ ද ශුභසිද්ධිය සඳහා උචිත විධිවිධාන සැලැස්වීම ; සහ

(xvi) සංස්ථාවෙහි කාර්යයන් මුදුන්පත් කර ගැනීමට ආනුෂංගික හෝ වැඩදායක වන සෙසු සියලු දේ කිරීම.".

ප්‍රධාන පනතේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන පනතෙහි 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අධ්‍යක්ෂ මණ්ඩලය.

10. (1) මේ වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාපනය කළ යුතු ය.

(2) මේ පනතෙහි විධිවිධාන අනුව ආණ්ඩුව විසින් සංස්ථාවට දෙන ලදුව ගෙවීමට තිබෙන යම් ණයක් ඇති තාක් කල්, (මෙහි මින් මතු "ආණ්ඩුවේ අධ්‍යක්ෂ" යනුවෙන් නම් කරනු ලබන) සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් එක් තැනැත්තකු කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විමසා කලින් කල පත් කිරීමට ද, ඒ තැනැත්තා ධුරයෙන් ඉවත් කිරීමට ද ඉල්ලා අස්වීමෙන්, මරණය සිදුවීමෙන්, ඉවත් කරනු ලැබීමෙන් හෝ අන් ලෙසකින් ඒ ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වූ විට ඒ පුරප්පාඩුව පිරවීම පිණිස අධ්‍යක්ෂවරයකු පත් කිරීමට ද මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාට හිමිකම් ඇත්තේ ය. ආණ්ඩුවේ අධ්‍යක්ෂ මාරුවෙන් මාරුවට විශ්‍රාම ගැනීමට හෝ ඉහත දැක්වෙන පරිදි භාර මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබීමට යටත් නො වන අතර සුදුසුකම් ලබන කොටස් කිසිවක් දැරීමට ද බැඳී නො සිටින්නේ ය. ඉහත දැක්වෙන ආකාරයට යටත් ව සංස්ථාවේ වෙන යම් අධ්‍යක්ෂවරයකු සතු අයිතිවාසිකම් හා වරප්‍රසාදවලට සමාන අයිතිවාසිකම් හා වරප්‍රසාද ලැබීමට ආණ්ඩුවේ අධ්‍යක්ෂ හිමිකම් ලබන අතර එසේ ම සමාන බැඳීම්වලට ද ඔහු යටත් වන්නේ ය.

(3) (මෙහි මින් මතු "පත් කළ අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂවරයකු වශයෙන් එක් තැනැත්තකු කලින් කල පත් කිරීමට ද ඒ තැනැත්තා ධුරයෙන් ඉවත් කිරීමට ද ඉල්ලා අස් වීමෙන්, මිය යාමෙන්, ඉවත් කරනු ලැබීමෙන් හෝ අන් ලෙසකින් ඒ ධුරයේ පුරප්පාඩුවක් ඇති

වූ විට ඒ පුරප්පාඩුව පිරවීම පිණිස අධ්‍යක්ෂවරයකු පත් කිරීමට ද කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාට හිමිකම් ඇත්තේ ය. පත් කළ අධ්‍යක්ෂ මාරුවෙන් මාරුවට විශ්‍රාම ගැනීමට හෝ ඒ අමාත්‍යවරයා විසින් හැර ධුරයෙන් ඉවත් කරනු ලැබීමට යටත් නො වන අතර සුදුසුකම් ලබන කොටස් කිසිවක් දැරීමට ද බැඳී නොසිටින්නේ ය. ඉහත දැක්වෙන ආකාරයට යටත් ව සංස්ථාවේ වෙන යම් අධ්‍යක්ෂවරයකු සතු අයිතිවාසිකම් හා වරප්‍රසාදවලට සමාන අයිතිවාසිකම් හා වරප්‍රසාද ලැබීමට පත් කළ අධ්‍යක්ෂ හිමිකම් ලබන අතර එසේ ම සමාන බැඳීම්වලට ද ඔහු යටත් වන්නේ ය.

(4) පහත දැක්වෙන තැනැත්තන් ඡන්දය දීමේ අයිතිවාසිකම නොමැතිව නිලබලයෙන් පත් වන සංස්ථාවේ අධ්‍යක්ෂවරයන් විය යුතු ය:—

(අ) ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා;

(ආ) සංස්ථාවෙහි සාමාන්‍යාධිකාරී ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා.

සුදුසුකම් ලබන කොටස් කිසිවක් දැරීමට නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරයන්ට නියම නො වන්නේ ය.

(5) මෙහි මින් මතු "කොටස් හිමි අධ්‍යක්ෂවරු" යනුවෙන් සඳහන් කරනු ලබන සය දෙනකුට අඩු නො වන සහ අටදෙනකුට වැඩි නො වන වෙනත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් සිටිය යුතු ය. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ආරම්භක කොටස් හිමි අධ්‍යක්ෂවරුන් පත් කළ යුතු ය. එසේ පත් කරනු ලැබූ ආරම්භක කොටස් හිමි අධ්‍යක්ෂවරුන් ගෙන් එක් කෙනකු, සංස්ථාවට ව්‍යාපාර කටයුතු කිරීමට හිමිකම් ලැබීමෙන් පසු, සංස්ථාවේ එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී විශ්‍රාම ගත යුතු ය. එසේ විශ්‍රාම ගත යුතු අධ්‍යක්ෂවරයා කුසපත් ඇදීමෙන් තීරණය කරනු ලැබිය යුතු ය. මේ උපවගන්තිය අනුව විශ්‍රාම ගන්නා හෝ වෙන යම් හේතුවක් නිසා සිය ධුරය පුරප්පාඩු වන ආරම්භක කොටස් හිමි අධ්‍යක්ෂවරයකුගේ යම් අනුප්‍රාප්තිකයකු ද යම් අලුත් කොටස් හිමි අධ්‍යක්ෂවරයකු ද 11 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවෙහි නියෝග අනුව තෝරා පත් කරනු ලැබ ධුරය දැරිය යුතු ය. ආරම්භක කොටස් හිමි අධ්‍යක්ෂවරයකු (6) වන උපවගන්තිය යටතේ තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් ඇතහොත් තමාගේ ම අනුප්‍රාප්තිකයා ලෙස තෝරා පත් කර ගනු ලැබීමට ඔහු සුදුස්සෙක්

වන්නේ ය. කොටස් හිමි අධ්‍යක්ෂවරුන්ගෙන් වැඩි දෙනකු සෑම විට ම ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(6) යම් තැනැත්තෙක්—

(අ) සංස්ථාවේ ප්‍රාග්ධනයෙහි රුපියල් පන්දහස කට නො අඩු මුල් අගයකින් යුත් කොටස් සතුව සිටි නම්, නැතහොත් සංස්ථාවේ ප්‍රාග්ධනයෙහි රුපියල් පන්දහසකට නො අඩු මුල් අගයකින් යුත් කොටස් ඇති සමාගමක හෝ හවුල් ව්‍යාපාරයක තිලධර යෙක්, අධ්‍යක්ෂවරයෙක් හෝ හවුල්කරු නො වේ නම්,

(ආ) මහජන මන්ත්‍රීවරයෙක් හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් හෝ නො වේ නම්,

(ඇ) සංස්ථාවෙහි වැටුප් ලබන සේවකයෙක් නො වේ නම්,

(ඈ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙන යම් රටක වලංගු යම් නීතියක් යටතේ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් කෙනකු වශයෙන් ප්‍රකාශ කරන ලදුව නිදහස් නො කරන ලද බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තෙක් නො වේ නම්,

(ඉ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙන යම් රටක වලංගු යම් නීතියක් යටතේ සිහි විකල වූවකු යැයි නිශ්චය නො කරන ලද නම් හෝ එසේ ඒ බවට ප්‍රකාශයට පත් නො කරනු ලැබ සිටි නම්; සහ

(ඊ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙන යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරනු ලැබූ බන්ධනාගාරගත කරනු ලැබීමේ දඬුවමක් විඳිමින් නො සිටි නම්

එසේ සිටින තාක් කල් කොටස් හිමි අධ්‍යක්ෂවර යකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට සහ ඒ ධුරය දැරීමට සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුව ද පළමුවරට කොටස් නිකුත් කරනු ලැබීමෙන් පසු දෙමසක් ගතවන තුරු මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි දැක්වෙන සුදුසුකම් ඇති ව සිටින ලෙස ආරම්භක කොටස් හිමි අධ්‍යක්ෂවරුන්ට නියම නො වන්නේ ය.

(7) කොටස් හිමි අධ්‍යක්ෂවරුන්ගෙන් කෙනකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විසින් තෝරා පත්කර ගත යුතු ය. ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත් මිස, ඒ තෝරා පත් කරගැනීම වලංගු නො වන්නේ ය.'.

10අ වන අලුත් වගන්තිය ප්‍රධාන පනතෙහි ඇතුළත් කිරීම.

4. ප්‍රධාන පනතේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ 10අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අමාත්‍යවරයාගේ විධානය.

10අ. මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය විමසීමෙන් පසු, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ පොදු විධාන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලියවිල්ලකින් කලින් කල නිකුත් කළ හැකි අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාවෙහි යෙදවිය යුතු ය.".

ප්‍රධාන පනතෙහි 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. 1967 අංක 1 දරන පනතින් සංශෝධිත ප්‍රධාන පනතෙහි 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් ණයට ගැනීම.

14. (1) ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් හෝ ආණ්ඩුව විසින් අනුමත කරන ලද වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශිය සංවිධානයකින් සංස්ථාව විසින් ගනු ලබන ණය සඳහා ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි අනුව ඇප වීමට ආණ්ඩුවට මෙයින් බලය පවරනු ලැබේ. මෙම උපවගන්තිය යටතේ ඇප වීමට බලය දෙනු ලබන ණය විදේශීය ව්‍යවහාර මුදල්වලින් සඳහන් කරනු ලැබිය හැකි ය. මෙම උපවගන්තිය යටතේ ඇප වන ලද සියලු ණය වල මුළු මුදල ඒ ඇප වීම අදාළ වන ණය ගිවිසුමේ දිනයෙහි පවත්නා විනිමය මිල ප්‍රමාණය අනුව රුපියල් හත්කෝටි විසි ලක්ෂයකට සමාන මුදලකට වැඩි වුවහොත් හෝ ඇප වීමට ඇති ණය මුදලෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ ඇප වීම අදාළ වන ණය ගිවිසුමේ දිනයෙහි පවත්නා විනිමය මිල ප්‍රමාණය අනුව රුපියල් හත්කෝටි විසි ලක්ෂයකට සමාන මුදලකට වැඩි වන්නේ නම් මේ උපවගන්තිය යටතේ කිසි ම ඇප වීමක් නො කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ඇප වීමක් අනුව ආණ්ඩුව විසින් ගෙවිය යුතු සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට මෙයින් වැය බර කරනු ලැබේ.

(3) ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් හෝ ආණ්ඩුව විසින් අනුමත කරන ලද වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින් හෝ (1) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ යම් ඇප වීමක් යටතේ ආණ්ඩුව විසින් සංස්ථාවට දෙන ලද යම් ණයක් පිළිබඳ මුල් මුදල, පොළිය හා වෙනත් අයකිරීම් සම්බන්ධයෙන් සංස්ථාව විසින් ගෙවිය යුතු සියලු මුදල්, ශ්‍රී ලංකාවේ යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද,—

(අ) ශ්‍රී ලංකාවේ යම් නීතියකින් හෝ එය යටතේ දැනට පනවා ඇති හෝ මින් මතු පනවනු ලබන බදු, අයකිරීම් හෝ ගාස්තු කිසිවක් සඳහා අඩු කිරීමක් නොමැතිව සහ ඒවායින් තොරව, සහ

(ආ) ශ්‍රී ලංකාවේ යම් නීතියකින් හෝ එය යටතේ දැනට පනවා ඇති හෝ මින් මතු පනවනු ලබන සියලු සීමාකිරීම්වලින් තොරව

ගෙවිය යුතු ය:

එසේ වුව ද යම් බැඳුම්කරයක් හෝ පොරොන්දු නෝට්ටුවක් ශ්‍රී ලංකාවෙහි නේවාසික පුද්ගලයකුට හෝ සංස්ථාවකට වැඩදායී ලෙස අයිතිව තිබෙන කල්හි ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව හෝ ආණ්ඩුව විසින් අනුමත කරන ලද වෙන යම් ජාත්‍යන්තර සංවිධානයක් හෝ විදේශීය සංවිධානයක් නො වන, බැඳුම්කරය හෝ පොරොන්දු නෝට්ටුව දරන්නාහට ඒ බැඳුම් කරය හෝ පොරොන්දු නෝට්ටුව යටතේ කෙරෙන ගෙවීම් සම්බන්ධයෙන් වූ බදු, අය කිරීම්, ගාස්තු හෝ සීමා කිරීම් කිසිවකට මෙම උපවගන්තියෙහි ඉහත දැක්වෙන විධිවිධාන අදාළ නො වන්නේ ය.

(4) (3) වන උපවගන්තියෙහි කාර්යයන් සඳහා, පුද්ගලයකු හෝ සංස්ථාවක් ශ්‍රී ලංකාවෙහි නේවාසික ද නැද්ද යන ප්‍රශ්නය 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 54 වන වගන්තියෙහි විධිවිධාන අනුව නිශ්චය කළ යුතු ය.

(5) ආණ්ඩුවත් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවත් අතර හෝ ආණ්ඩුව හා මේ පනත අනුව ආණ්ඩුව විසින් අනුමත කරන ලද වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකුත් අතර වූ සෑම ඇප ගිවිසුමක් සහ එබඳු යම් ඇප ගිවිසුමක් අනුව ආණ්ඩුව විසින් කරනු ලබන සෑම ඇප වීමක් ද, ශ්‍රී ලංකාවෙහි යම් නීතියක පට

හැනිව කුමක් සඳහන් ව ඇත ද, ඒවායෙහි පිළිවෙලින් අඩංගු නියමයන් අනු ව වලංගු වන අතර ක්‍රියාත්මක කළ හැකි ද වන්නේ ය.

(6) ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් හෝ ආණ්ඩුව විසින් අනුමත කරන ලද වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් විසින් සංස්ථාවට දෙන ලදුව ආණ්ඩුව විසින් ඇප වූ යම් ණයක් සම්බන්ධයෙන් වූ විට, ඒ සම්පූර්ණ ණය හෝ ඉන් කොටසක් ප්‍රකාශිතව ඇත්තේ හෝ ආපසු ගෙවිය හැකි වන්නේ යම් ව්‍යවහාර මුදලකින් හෝ යම් ව්‍යවහාර මුදල් වලින් ද ඒ ව්‍යවහාර මුදලට හෝ ව්‍යවහාර මුදල් වලට අදාළ ඒ ශ්‍රී ලංකාවේ රුපියල නැවත අගය කිරීමකින් ඇති වන යම් අලාභයක් ආණ්ඩුව විසින් දැරිය යුතු අතර එසේ ඇති වන යම් ලාභයකට ද ආණ්ඩුව හිමිකම් ලබන්නේ ය.

එබඳු සෑම අලාභයක ම මුදල ඒකාබද්ධ අරමුදලට මෙයින් වැය බර කරනු ලැබේ.

(7) ආණ්ඩුවත්, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවත් අතර හෝ ආණ්ඩුව හා ආණ්ඩුව විසින් අනුමත කරන ලද වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් අතර යම් ඇප ගිවිසුමක් ආණ්ඩුව වෙනුවෙන් අත්සන් කිරීමට සභාපතිට හෝ සභාපතිගේ අත්සන යටතේ වූ සාධන පත්‍රයකින් ඔහු විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට හෝ මෙයින් බලය පවරනු ලැබේ.

(8) වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් හෝ ආණ්ඩුව විසින් අනුමත කරන ලද වෙන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින් සංස්ථාව විසින් ගනු ලබන යම් ණයක් සම්බන්ධයෙන් සංස්ථාව විසින් ලියා අත්සන් කරනු ලබන කිසි ම ගිවිසුමක්, බැඳුම්කරයක් හෝ වෙනත් ලේඛනයක් කවර වූ හෝ මුද්දර ගාස්තුවකට හෝ ගාස්තුවලට හෝ යටත් නො විය යුතු ය; නැතහොත් ඒ සඳහා කවර වූ හෝ මුද්දර ගාස්තුවක් හෝ ගාස්තු හෝ අය නො කළ යුතු ය.

(9) එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඒ මුදල් වර්ෂය තුළ සංස්ථාවේ ගණන් ප්‍රකාශය පිළිබඳ වූ ද මේ පනත යටතේ ඇතුළත් වූ සෑම ණයක්, බැඳුම්කරයක් හා ඇප වීමක් හා සම්බන්ධ ප්‍රකාශය පිළිබඳ වූ ද වාර්තාව හැකි තාක් ඉක්මණින් ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරවිය යුතු ය.".

6. 1967 අංක 1 දරන පනතින් සංශෝධිත ප්‍රධාන පනතෙහි 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන පනතෙහි 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

'අර්ථ නිරූපණය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ ;

"කාර්මික ව්‍යාපාරය" යන්නෙන් නිෂ්පාදන කාර්යයක් සඳහා වාණිජ පදනමක් මත කරගෙන යනු ලබන ව්‍යාපාරයක් අදහස් වේ ;

"කොටස්කරු" යන්නෙන් සංස්ථාවේ කොටස් කරුවෙක් අදහස් වේ ;

"කෘෂිකාර්මික ව්‍යාපාරය" යන්නෙන් වාණිජ පදනමක් මත කරගෙන යනු ලබන කෘෂි කාර්මික හෝ සත්ව පාලන ව්‍යාපාරයක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක්, ගම් සභාවක්, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය හෝ යම් ප්‍රදේශයක් කෙරෙහි පරිපාලන බලතල ඇති වෙන යම් බල මණ්ඩලයක් අදහස් වේ ;

"පාලන මණ්ඩලය" යන්න යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට ඒ ව්‍යාපාර යෙහි ව්‍යාපාර හෝ කටයුතුවල කළමනා කාරිත්වය හෝ පාලනය හෝ එහි යම් කොටසක් තත් කාලයෙහි භාරදෙනු ලැබ සිටින කවර වූ හෝ නාමයකින් හෝ නිල නාමයකින් වුව ද හඳුන්වනු ලබන යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ; තවද

"වාණිජ ව්‍යාපාරය" යන්නෙහි ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුවට වැඩදායක වන්නා වූ ද කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයක විස්තරයට නොගැනෙන්නා වූ ද යම් ව්‍යාපාරයක් ඇතුළත් වේ.'.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.